# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1950/28 - 2016 ජනවාරි මස 19 වැනි අඟහරුවාදා - 2016.01.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/38/2011

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.08.10 දිනැති හා අංක 1770/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.07.27 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වේයන්ගොඩ, බාදුරාගොඩ පාර, පැලැන්කලන්වත්ත, අංක එෆ් 22, හි පදිංචි ආර්. එම්. ජී. රාමනායක මයා/කැළණිය, සිංහාරමුල්ල, ශ්‍රමදාන මාවත, අංක 53 හි පදිංචි ආර්. එච්. හේමසිරි මයා (නිවැරදි නම ආර්. ඒ. හේමසිරි)/ගනේමුල්ල, බුලුගහගොඩ, අංක 121 ඩී හි පදිංචි ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න මයා/උඩුගම්පොල, කජුගොල්ල, රජවත්ත පාර, අංක 426/19 හි පදිංචි එච්. එම්. ජේ. බණ්ඩාර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.11.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/38/2011

කාර්මික අධිකරණයේ දී ය.

1. ආර්. එම්. ජී. රාමනායක
   අංක එෆ් 22, පැලැන්කලන්වත්ත
   බාදුරාගොඩ පාර, වේයන්ගොඩ
2. ආර්. එච්. හේමසිරි
   (නිවැරදි නම : ආර්. ඒ. හේමසිරි)
   අංක : 53, ශ්‍රමදාන මාවත,
   සිංහාරමුල්ල, කැළණිය
3. ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න
   අංක : 121 ඩී, බුලුගහගොඩ
   ගනේමුල්ල
4. එච්. එම්. ජේ. බණ්ඩාර
   අංක : 426/19, රජවත්ත පාර,
   කජුගොල්ල, උඩුගම්පොල

- පළමු පාර්ශ්වය -

නඩු අංකය : A - 3466

- සහ -

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක : 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

- දෙවන පාර්ශ්වය -

අතර පවතින කාර්මික ආරාවුල

ප්‍රදානය

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2012.07.27 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ආරවුලට හේතු වී ඇති කාරණය*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරිය විසින් 2012.07.19 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ ;

''2008.08.10 දින වෘත්තීය ක්‍රියාමාර්ගයකට සහභාගි වීම මත, එදින වැටුප් රහිත නිවාඩු බවට ප්‍රකාශයට පත් කිරීම තුළ ආර්. එම්. ජී. රාමනායක මහතා ඇතුළු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් සිව් දෙනෙකු හට අසාධාරණයක් සිදුව ඇතැයි සඳහන් වීම හරහා ඔවුනට කවර සහන ලබාදිය හැකිද යන්න පිළිබඳව වේ'' යනුවෙනි.

*සටහන :* කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යතුමා විසින් කර ඇති ඉහතින් සඳහන් කළ නියෝගයට ඇතුළත් යොමුවේත්, කම්කරු කොමසාරිස් විසින් ආරවුලට හේතු වී ඇති කාරණයේත් අඩංගු කරුණු අතුරෙන් පහත සඳහන් කරුණු දෙක දෝෂ සහිත ව සටහන් වී ඇති බැවින් ඒවා නිවැරදි විය යුතු බව 2012.09.19 දින විභාගය ආරම්භ කළ දිනයේ දී ම පළමුවැනි පාර්ශ්වය මගින් කරුණු දක්වනු ලැබිය.

1. වෘත්තීය ක්‍රියාමාර්ගයකට සහභාගි වූ දිනය ලෙස දක්වා ඇති ''2008.08.10 දින'' යන්න ''2008.07.10 දින'' යනුවෙන් නිවැරදි විය යුතු බව,
2. පළමු පාර්ශ්වයේ පාර්ශ්වකරුවන්ගේ නම් අතර ''ආර්. එච්. හේමසිරි මයා'' යන්න ''ආර්. ඒ. හේමසිරි මයා'' යනුවෙන් නිවැරදි විය යුතු බව.

එකී නිවැරදි කිරීම් කම්කරු කොමසාරිස් වෙත දන්වා යැවීමට එදින මා විසින් අනුමතිය ලබා දෙන ලදී.

එකී මාගේ තීරණය දෙන ලද අවස්ථාවේ දෙවන පාර්ශ්වයෙන් කිසිදු විරෝධාවක් පළ නොවී ය. කෙසේ වුවත් මාගේ එකී තීරණය මත බේරුම්කරණ කාර්යාලය විසින් කම්කරු කොමසාරිස්වරයාගෙන් එම නිවැරදි කිරීම් කරවාගත් බවක් නොපෙනේ. දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයේ ආරම්භයේ යොමුව යන ශීර්ෂය යටතේ ඒ බව සඳහන් කර තිබුන ද විභාගයේ කවර අවස්ථාවක දී වත් එකී දෙවන පාර්ශ්වය හෝ පළමුවන පාර්ශ්වය විසින් යොමුවේ නිවැරදි කිරීම් කිරීමේ අවශ්‍යතාවක් මතු කළේ නැත. ඒ සම්බන්ධ කිසිදු විරෝධතාවක් ද දෙපාර්ශ්වයෙන් ම පැන නැගුණේ නැත. මේවා හුදෙක් යතුරු ලිවීමේ දෝෂයන් මිස විභාගයේ ප්‍රස්තුතයට තද බලපෑමක් සිදු නොකෙරන සුළු දෝෂයන් වන නිසා ඒවා පිළිගෙන දෙපාර්ශවය විසින් ම විභාගයට සහභාගි විය.

*පෙනී සිටීම*

මෙම නඩුවේ පළමුවැනි පාර්ශ්වය ලෙස තමන් වෙත අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන ආර්. ඒ. හේමසිරි බේරුම්කරණ නඩු කටයුත්ත පුරා ම ඊට සහභාගි විය. විභාගය පැවති දිනයන් අතුරෙන් 2012.10.24 දින එච්. එම්. ජේ. බණ්ඩාර මහතාත්, 2013.01.28 දින ආර්. එම්. ජී. රාමනායක මහතාත්, 2013.11.14 දින ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න නොපැමිණි අතර අනෙක් සෑම විභාග දිනයක දීම එකී ඉල්ලුම් කරුවෝ ද සහභාගි වූහ. ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් 2014.04.28 වන දින තෙක් බේරුම්කරණ විභාගයට පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ නීතිඥ ඩබ්ලිව්. පී. වීරසිංහ මහතා ය. නීතිඥ ඩබ්ලිව්. පී. වීරසිංහ මහතා මේ අතරතුර මිය ගිය බැවින් ඊට පසු ව විභාගය පැවති 2014.06.18 සහ 2014.07.03 යන දිනයන්හි දී පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියේ බලය පවරනු ලැබූ නියෝජිත ග්‍රේෂන් ද සිල්වා මහතා ය.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් කළමනාකරු ටී. ආර්. ඩබ්ලිව්. ඇලපාත මහතා දිගට ම පාහේ විභාගයට සහභාගී වූ අතර වරින් වර එහි උසාවි ලිපිකාරිනි රංජනී ඒකනායක මහත්මිය පෙනී සිටියා ය. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් බේරුම්කරණ විභාගයේ දී ආරම්භයේ දී මූලික ප්‍රකාශය සහ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ පටන් 2012.09.19 දින සිට බේරුම්කරණ විභාගය අවසන් වන තෙක් නීතිඥ ඒ. එම්. එම්. කලීල් මහතා පෙනී සිටියේ ය.

*බේරුම්කරණ විභාග පටිපාටිය*

මෙම බේරුම්කරණ විභාගය 2012.09.19 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. පළමු සහ දෙවැනි ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබ, ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසුවූයෙන් විභාගය ඇරඹුණි. බේරුම්කරණ විභාගය පහත සඳහන් දිනයන් හි දී වාර 19 කට කැඳවන ලදී. කෙසේ වෙතත් ඒ කාලය අතරතුර පැවැත්වීමට නියම කරන ලද 2013.08.19 දින පරීක්ෂණය නොපැවති අතර ඊළඟට පැවැත්වුනේ 2013.08.21 දින දී ය. තවද දින නියම කරනු ලැබුවත් පරීක්ෂණය 2013.09.18 නොපැවති අතර එය 2013.10.11 දින පවත්වා ඇත.

මෙම ප්‍රදානයේ සඳහන් වන සහනයක් ඉල්ලා සිටින ඉල්ලුම්කරුවන් හතර දෙනා අතුරෙන් ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න මහතාත්, ආර්. ඒ. හේමසිරි මහතාත් බේරුම්කරණ විභාගයේ පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබුණි. කාලය ඉතිරි කර ගැනීමේ සහ පටිපාටිය ලඝු කර ගැනීමේ අරමුණෙන් අනෙක් ඉල්ලුම්කරුවන් සහ වෙනත් සාක්ෂිකරුවන් පළමුවැනි පාර්ශ්වය විසින් සාක්ෂි විභාගයට කැඳවනු නොලැබුණි.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් කළමනාකරු ටී. ආර්. ඩබ්ලිව්. ඇලපාත මහතා සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබිණි. පළමුවන පාර්ශ්වය විසින් P1 සිට P34 දක්වා ලේඛනත්, දෙවැනි පාර්ශ්වය විසින් R1 සිට R 15 දක්වා ලේඛනත් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. දෙවැනි පාර්ශ්වය විසින් ලේඛන ලකුණු කිරීමේ දී ප්‍රමාද දෝෂයකින් ලේඛන දෙකක් R 10 වශයෙන් ලකුණු කර ඇත. මෙම ප්‍රදානය සකස් කිරීමේ දී එම දෝෂය කිසිදු පාර්ශ්වයකට අගතියක් නොවන ආකාරයෙන් සැළකිල්ලට ගන්නා ලදී.

පළමුවැනි පාර්ශ්වය ගොඩනැගීමට උත්සහ ගත් ස්ථාවරයන්

- පළමුවැනි පාර්ශ්වයේ ;
  1. එච්. එම්. ජේ. බණ්ඩාර,
  2. ආර්. එම්. ජී. රාමනායක,
  3. ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න සහ
  4. ආර්. ඒ. හේමසිරි යන සහනයන් ඉල්ලා සිටින හතර

දෙනා සමස්ත ලංකා පොදු සේවක සමිතියේ සාමාජිකයන් බව.

- රු. 5,000/- ක වැටුප් වැඩි කිරීමක් ඇතුළු ඉල්ලීම් තුනක් මුල් කරගෙන 2008.07.10 වැනි දින සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය මෙහෙයවූ එක් දින සංකේත වැඩ වර්ජනයට සෙසු සාමාජිකයන් ද සමග සහභාගි වූ බව.

- එම සංකේත වැඩ වර්ජනය නීත්‍යානුකූල වෘත්තීය ක්‍රියාමාර්ගයක් බව.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ඇතුළු බලධාරීන්ට පිටපත් සහිත ව වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයාට 2008.06.06 දිනැති ලිපයකින් (P1) ඉහත කී වෘත්තීය සමිතිය ඉල්ලීම් තුනක් ඉදිරිපත් කළ බව.

- එකී ලිපියට යහපත් ප්‍රතිචාර නොලැබීමේ හේතුවෙන් 2008.07.10 දින සංකේත වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරන බව 2008.06.26 දිනැති ලිපියෙන් (P2) ශ්‍රී ලංකා වරයා අධිකාරියේ සභාපතිවරයා ඇතුළු බලධාරීන්ට පිටපත් සහිතව වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයාට විධිමත් ලෙස නිවේදනය කළ බව.

- අදාළ වෘත්තීය ක්‍රියාමාර්ගය ගන්නා බවට ඒ අනුව දින 14 කට කලින් ප්‍රමාණවත් දැනුම් දීමක් කරන ලද බව.

- එම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය කඩාකප්පල් කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනාධිකාරිය ක්‍රියා කළ බව.

- 2008.07.10 දිනට නිවාඩු අවලංගු කිරීමේ චක්‍රලේඛයක් (P3) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩ බලන සභාපති විසින් නිකුත් කළ බව.

- වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය කඩාකප්පල් කිරීමේ අරමුණෙන් 2008.07.10 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින්ට විශේෂ ප්‍රවාහන පහසුකම් සැළසීම.

- P 3 නිවාඩු අවලංගු කිරීමේ චක්‍රලේඛය උපයෝගී කරගෙන 2008.07.10 දින සංකේත වැඩවර්ජනයේ යෙදුණු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයින් එක් දිනක වැටුප් රහිත නිවාඩු ගැන්වූ බව

- 1998.10.21 දිනෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විසින් නිකුත් කර ඇති ''උසස්වීම්වලදී වැටුප් රහිත නිවාඩු හා විනය දඬුවම්වල බලපෑම'' යන හිසින් නිකුත් කළ ලේකම් කාර්යාලීය චක්‍රලේඛ අංක : 212 (R2) හි හතරවැනි ඡේදය ප්‍රකාර ව, 2008.07.10 දින සංකේත වැඩවර්ජනයට සහභාගි වීම හේතුවෙන් ඉල්ලුම්කරුවන් වැටුප් රහිත නිවාඩු ගැන්වීමෙන් තමන් බරපතල අසාධාරණයකට ලක් වූ බව.

- ස්වකීය වෘත්තීය සමිතියේ අනෙකුත් සාමාජිකයින් සමග එක් ව 2008.07.10 දින පැවති සංකේත වැඩවර්ජනයට සහභාගි වීම හේතුවෙන් ඉල්ලුම්කරුවන් හතර දෙනාට තත් කාලයන්හි දී ලැබිය යුතු පහත සඳහන් පරිදි උසස්වීම් අහිමි කරනු ලැබ ඇති බව. පළමුවැනි පාර්ශ්වයේ පළමුවැනි ප්‍රකාශයේ 10 ඡේදය සමග කියවිය හැකි එකී පාර්ශ්වයේ ලිඛිත සැළකිරීම්වල අවසාන පිටුවේ දක්වා ඇත.

(අ) ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න යන අයට 2009 අප්‍රේල් මස සිට ලැබීමට නියමිත වූ වැඩ අධිකාරි විධායක 1 වැනි තනතුර අහිමි කිරීම මත තනතුරට හිමි වැටුප හා සෙසු වරප්‍රසාද අහිමි කිරීම,

(ආ) එච්. එම්. ජේ. බණ්ඩාර යන අයට 2009 අප්‍රේල් සිට ලැබීමට යුතු ව තිබූ ගබඩා භාරකරු 1 ශ්‍රේණියට උසස්වීම නොලැබීම හා සෙසු වරප්‍රසාද අහිමි කිරීම,

(ඇ) ආර්. ඒ. හේමසිරි යන අයට 2009 අප්‍රේල් මස සිට ලැබිය යුතු පරිපාලක 11 තනතුර අහිමි කිරීම හා එම තනතුරට අදාළ වැටුප් හා සෙසු අයිතීන් අහිමි කිරීම, සහ

(ඈ) ආර්. එම්. ජී. රාමනායක යන අයට 2009 අප්‍රේල් මස සිට හිමි විය යුතු ව තිබූ ගබඩා භාරකාර 1 වැනි ශ්‍රේණියේ උසස්වීම අහිමි කිරීම හා එම තනතුරට අදාළ වැටුප් හා සෙසු වරප්‍රසාද අහිමි කිරීම.

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලක (යාන්ත්‍රික) 1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවූ අවස්ථාවක (P15) ඉහත සඳහන් හේමසිරි යන අය ඉල්ලුම් පතක් (P16) ඉදිරිපත් කළ බව සහ ඒ අනුව පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ දී අසාධාරණ ලෙස ඔහු ඉවත් කරන ලද බව.

එසේ හේමසිරි යන අයට උසස් වීම් අහිමි වූයේ 2008.07.10 වැනි දින සංකේත වැඩ වර්ජනයට සහභාගි වීමේ හේතුවෙන් ඔහු වැටුප් රහිත නිවාඩු ලැබීම නිසා බව.

එච්. එම්. ජේ. බණ්ඩාර, ආර්. එම්. ජී. රාමනායක සහ ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න යන තිදෙනාට ස්වයංක්‍රීය ව ලැබිය යුතු වූ උසස් වීම් අහිමි වූයේ 2008.07.10 වැනිදින සංකේත වැඩ වර්ජනයට සහභාගි වීමේ හේතුවෙන් ඔවුන් වැටුප් රහිත නිවාඩු ලැබීම නිසා බව.

*දෙවැනි පාර්ශ්වය ගොඩනැගීමට උත්සාහ ගත් ස්ථාවරයන්*

- ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩ බලන සභාපතිගේ අත්සනින් 2008.07.08 දින නිකුත් කරන ලද ''නිවාඩු අවලංගු කිරීම'' නැමති චක්‍රලේඛයක් මගින් 2008.07.10 දිනට එහි සේවකයන්ගේ නිවාඩු අවලංගු කර නොමැති බව සහ කර ඇත්තේ නිවාඩු අවශ්‍ය වේ නම් වැ. බ. සභාපති වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ව තිබූ බව දැනුම් දී තිබීම.

- ආයතනයේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය හා විනය නීති මාලාවට අනුකූලව නිසි පරිදි නිවාඩු අනුමත කරවා නොගෙන කවර හෝ හේතුවක් නිසා සේවයට නොපැමිණි අය පත් වන්නේ වැටුප් රහිත නිවාඩු ගණයට බව සහ පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හතර දෙනා, සේවකයන් නිවාඩු අනුමත කරවා ගත යුතු නිසි පටිපාටියට අනුකූලව නිවාඩු අනුමත කරවා නොගෙන 2008.07.10 දින සේවයට නොපැමිණීමෙන් ඒ එක් කෙනා එක් දිනක වැටුප් රහිත නිවාඩු ගන්වනු ලැබූ බව.

- මේ ආකාරයෙන් වැටුප් රහිත නිවාඩු යැවීම මෙම බේරුම්කරණයට අදාළ පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පමණක් ක්‍රියාත්මක කළ දෙයක් නොව පොදුවේ ආයතනයේ ප්‍රතිපත්තියක් වශයෙන් ක්‍රියාත්මක වන කාරණයක් බව

- නිසි පරිදි නිවාඩු අනුමත කරවා නොගෙන සේවයට නොපැමිණෙන සේවකයින්ට වැටුප් ලබා දීමේ නෛතික හැකියාවක් ආයතනයට නොමැති බව

- එකී හතර දෙනා අතුරෙන් ආර්. ඒ. හේමසිරි යන අයගේ උසස් වීම නොලැබීමට එක ම හේතුව එක් දිනක වැටුප් රහිත නිවාඩුව තිබීම පමණක් නොවන බව

- 2008.07.10 වැනි දින සංකේත වැඩවර්ජනයට සහභාගි වීම නිසා වැටුප් රහිත නිවාඩු ගැන්වීම හේතුවෙන් උසස් වීම් අහිමි වූ කේ. ඩී. රණවීර නමැති වෙනත් සේවකයෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ පෙත්සමක් පිළිබඳ අංක : SC/FR/309/09 දරන නඩුව විභාගයට නොගෙන ම ප්‍රතික්ෂේප කරනු ලැබූ බව (R6) සහ උපරිමාධිකරණයක විනිශ්චයක පූර්වගම්‍ය න්‍යාය මත පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හතර දෙනාට බේරුම්කරණයෙන් සහනයක් ලබා ගැනීමට ඉඩක් නොලැබෙන බව

- ඉහත කී නඩුවෙන් පසු ව පළමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් මෙම ඉල්ලීම් පදනම් කරගෙන කම්කරු කොමසාරිස්වරයාට පැමිණිළි කළ නමුත් ඔහු පැවැත්වූ විභාගයට ඉල්ලුම්කරුවන් සහභාගි නොවූ බව

- දෙවන පාර්ශ්වයේ ආයතනය ආර්ථිකයේ වැදගත් මෙහෙවරක් ඉටු කරන තැනක් බැවින් දැඩි සේවක විනයක් පවත්වා ගනිමින් ජාතික මෙහෙවරක යෙදීමේ වගකීමෙන් බැඳෙන බව

- මෙම පරීක්ෂණයේ දී හේමසිරි සහ ප්‍රේමරත්න යන දෙදෙනාගේ සාක්ෂි මෙහෙයවනු ලැබූවත් අනෙක් ඉල්ලුම්කරුවන්ගේ සාක්ෂි මෙහෙයවීමක් නොකෙරුණු බැවින් ඔවුන්ට අහිමි වූයේ කවර ආකාරයේ උසස් වීම් ද යන්න පැහැදිළි නොවන බව

**නිරීක්ෂණ**

දෙපාර්ශ්වය විසින් සපයන ලද පළමුවැනි සහ දෙවැනි ප්‍රකාශ ද, සාක්ෂි විභාගයේ දී පළමුවැනි හා දෙවැනි පාර්ශ්වයන් විසින් මෙහෙයවන ලද සාක්ෂි ද, ලකුණු කළ ලේඛන ද, ඔවුන් ඉදිරිපත් කළ ලිඛිත සැලකිරීම් ද ඉතා පරීක්ෂාවෙන් සමාලෝචනය කළ විට පහත සඳහන් නිරීක්ෂණයන් පළ කළ හැකි ය.

- තමන් සාමාජිකත්වය දරන වෘත්තීය සමිතිය 2008.07.10 වැනි දින ක්‍රියාත්මක කළ එක් දින සංකේත වැඩවර්ජනයට සහභාගි වීම නිසා මෙහි පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් කෙරෙහි පොදුවේ බල පා ඇති තත්ත්වය සැළකිල්ලට ගැනීම වටී. සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් විසින් ශ්‍රී ලංකා වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම්, වරාය අධිකාරියේ සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ යන අයට පිටපත් සහිත ව වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා වෙත රු. 5,000/- ක වැටුප් වැඩි කිරීමක් ඇතුළු ඉල්ලීම් තුනක් ලබා දෙන ලෙස 2008.06.06 දිනැති ලිපිය (P1) ඉදිරිපත් කර ඇත.

අදාළ ඉල්ලීම් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමේ හේතුවෙන් ඉන් පසුව 2008.06.28 දින ඉහත කී බලධාරීන්ට ම පිටපත් සහිත ව වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයා ඇමතු තවත් ලිපියකින් (P2) එකී වෘත්තිය සමිතිය 2008.07.10 වැනි දින එක් දින වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කරන බවට නිල දැනුම් දීමක් කර ඇත.

ඒ අනුව දින 14 ක පූර්ව දැනුම් දීමක් සහිත ව අදාළ වෘත්තිය සමිතිය 2008.07.10 වැනි දින එක් දින සංකේත වැඩ වර්ජනයක් දියත් කර ඇත. මෙහි පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හතර දෙනා ද සෙසු සගයන් සමග 2008.07.10 දින පැවති එකී සංකේත වැඩ වර්ජනයට සහභාගි වී ඇත.

මේ අතුරතුර ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වැඩ බලන සභාපතිගේ අත්සනින් ''නිවාඩු අවලංගු කිරීම'' යන මැයින් වරාය අධිකාරිය චක්‍රලේඛ අංක 16/2008 මගින් දැනුම් දී ඇත්තේ, ''................. 2008.07.10 දින කිසිම සේවකයෙකු සඳහා නිවාඩු ලබා නොදිය යුතු අතර වෛද්‍ය හේතූන් හෝ වෙනත් විශෙෂ හේතූන් මත නිවාඩු නිර්දේශ කරනු ලබන සේවකයින් සඳහා වැඩ බලන සභාපතිගේ පූර්ව අනුමතිය ලබා ගත යුතු ............'' බවයි. ඒ අනුව එදින වැඩ වර්ජනයේ නිරත වූ වරාය අධිකාරි සේවකයින් එක් දිනක වැටුප් රහිත නිවාඩු ගන්වනු ලැබිණි.

දෙපාර්ශ්වය ගොඩ නැගූ ස්ථාවරයන් මත මේ කාරණය දැඩි විවාදයකට භාජනය වූ සහ තීරණයක් දිය යුතු වැදගත් ම කාරණය වේ. පරිපාලන කාර්ය සංග්‍රහයේ ''නිවාඩු ලබා ගැනීමේ පටිපාටිය'' පිළිබඳ පරිච්ඡේදය දෙවන පාර්ශ්වය විසින් R3 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන ලද අතර එහි 155 වැනි රීතියේ නිවාඩු අනුමත කරවා ගැනීමේ උපචාරයන් ඇතුලත් ය. එහි 157 වැනි රීතියේ ''නිවාඩු නොලබා සේවයට නොපැමිණ සිටින යම් කාල සීමාවක් සඳහා කිසියම් සේවකයෙකුට වැටුපක් නොගෙවිය යුතුය'' යනුවෙන් සඳහන් වේ. දෙවන පාර්ශ්වයේ ආයතනය දිගින් දිගට ම තහවුරු කිරීමට උත්සාහ කළ තත්ත්වය වන්නේ වැඩවර්ජනයක නිරත වීමේ හේතුව මත වුව ද සේවයේ නොයෙදුණු දිනයක් සඳහා එහි සේවකයෙකුට වැටුපක් ගෙවීමට ඉඩක් නොමැති බව ය.

මෙහි දී දෙවන පාර්ශ්වය අන් සියළු කරුණු පසෙක තබා උත්සාහ ගත්තේ, ''එසේ වුවහොත් මෙසේ විය යුතු ය'' යනුවෙන් හේතුවක් සහ ඵලයක් ලෙස දක්වමින් එකිනෙක ඇඳූ පුරුක් දෙකක් ලෙස මේ කරුණු දෙක හුදු තර්කයකට පමණක් ගෝචර වන තත්ත්වයක් මතු කිරීමට ය. කිසියම් සේවකයෙකු විධිමත් ලෙස නිවාඩු අනුමත කරනොගෙන සේවයට වාර්තා නොකළහොත් පවත්නා රෙගුලාසි ප්‍රකාර ව ඔහුට/ඇයට එදිනට වැටුප් ගෙවිය නොහැකි ය යන්න සත්‍යයකි.

මෙහි දී ගැටලුව උද්ගත වන්නේ වැටුප් නොගෙවීම නිසා වන දිනක වැටුප් අහිමි වීමට වඩා ඉන් සේවකයින්ගේ උසස් වීම් කෙරෙහි ඇති කරන අහිතකර ප්‍රතිවිපාකයයි. R2 ලෙස ලකුණු කොට ඉදිරිපත් කළ අධිකාරියේ ලේකම් කාර්යාලීය චක්‍රලේඛ අංක : 212 හි 4 වැනි ඡේදයේ ''............. වසරක් තුළ දින 1/2 ක් හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා සේවකයින්, 1999.01.01 සිට උසස් කිරීම් සඳහා සළකා බලනු නොලැබේ......'' යනුවෙන් සඳහන් වේ.

ඉහත කී R3 හි සඳහන් 157 රීතිය ද, R2 හි 4 වැනි ඡේදයේ සඳහන් විධිවිධානය ද ඒකාබද්ධ ව ක්‍රියාත්මක වීමේ දී වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක නියැලෙන සේවකයෙකුට බලවත් අසාධාරණයක් සිදු

වේ. එබැවින් දෙවැනි පාර්ශ්වය දිගින් දිගට ම මේ කරුණු දෙක තනි තනි වශයෙන් ගෙන සාධාරණීකරණය කරන්නට උත්සාහ ගත්ත ද ඒ කරුණු දෙක එකට ක්‍රියාත්මක වීමෙන් සේවකයින්ගේ වෘත්තිය අයිතිවාසිකම් වලට සිදුවන අගතිය නොසළකා හැරිය නොහැකි ය. එසේ වන්නේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයක නියැලීම නිසා වැඩ කරන සේවකයෙකුගේ තත්ත්වය වැඩ පැහැර හැරීම, නොසැළකිළිමත්කම වැනි වූ හේතුන් මත නිවාඩු නොලබා සේවයට නොපැමිණෙන කෙනෙකුගේ තත්ත්වයට වඩා බෙහෙවින් ම වෙනස් නිසා ය.

මේ පදනම සිද්ධාන්තයක් වශයෙන් ගතහොත් ස්වකීය වෘත්තිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන් කිසිදු වෘත්තිය සමිතියක සාමාජිකත්වයක් දරන සේවකයෙකුට වැඩ වර්ජනයක නිරත වීමේ ඉඩ ප්‍රස්තාවක් නොලැබී යනු ඇත. මේ කාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පාලනාධිකාරිය විසින් සපයා ඇති ඉතා සාධනීය පූර්වාදර්ශයක් මෙම බේරුම්කරණ විභාගයේ දී ඉදිරිපත් විය. එනම් P24 ලෙස ලකුණු කොට ඉදිරිපත් කළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් ''1996.12.27 වැඩ වර්ජන දිනය වැටුප් රහිත නිවාඩු ලෙස සැළකීම'' යන හිසින් යුතු ව 1997.12.09 වැනි දින නිකුත් කර ඇති චක්‍රලේඛයේ සඳහන් වන්නේ ''1996.12.27 වන දින සේවයට වාර්තා නොකළ එදින සඳහා නිවාඩු ආවරණය කර ගැනීමට අපොහොසත් වූ හා එම දින පැවති වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයට අවනත වූ සේවකයින්ට එදිනට වැටුප් අහිමි කළ යුතු වේ. (එම දිනය වැටුප් රහිත නිවාඩු සේ නොසැළකිය යුතු ය.)'' යනුවෙන් ය.

පළමුවැනි පාර්ශ්වය P24 ලේඛනය ලකුණු කරමින් ආයතනයේ සාක්ෂිකරුගෙන් කරන ලද හරස් ප්‍රශ්න විමසීම් වල දී (2014.01.27 දින කාර්ය සටහන් පිටු අංක 3-6) සහ දෙවන පාර්ශ්වයේ නීතිඥවරයා සාක්ෂිකරුගෙන් කරන ලද නැවත ප්‍රශ්න විමසීමේ දී (2014.07.03 දින කාර්ය සටහන් පිටු අංක : 7-8) මතු වූ කරුණු සැළකිල්ලට භාජනය කරන ලදී.

- මෙම බේරුම්කරණ විභාගයේ තීරණයක් ගැනීමේ දී දැඩි ලෙස අවධානය යොමු කළ යුතු ඉතා වැදගත් කාරණයක් වන්නේ දෙවැනි පාර්ශ්වය විසින් එහි වාසියට ඉදිරිපත් කර ඇති, ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක : SC/FR/309/09 දරන මූලික අයිතිවාසිකම් නඩුකරයේ තීන්දුව මෙම බේරුම්කරණයට අදාළ කර ගැනීම පිළිබඳ තත්ත්වයයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයෙකු වූ කේ. ඩී. රණවීර නැමැත්තා 2008.07.10 දින පැවති මෙම බේරුම්කරණ විභාගයට ම අදාළ සංකේත වැඩවර්ජනයට සහභාගි වීම නිසා ඉහතින් සඳහන් කළ 16/2008 චක්‍රලේඛයේ විධානයට අනුකූල ව වැටුප් රහිත නිවාඩු ගැන්වීමේ හේතුවෙන්, ලැබීමට නියමිත ව තිබුණු වාත්තු කරු (විශේෂ ශ්‍රේණිය) ට උසස් කිරීම අහිමි වූ බවට චෝදනා කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2) සහ 14(I)(d) ව්‍යවස්ථාවන්ගෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබ ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති පෙත්සමකි.

එකී පෙත්සමේ කොටස් R11, R12, R13 සහ R14 වශයෙන් ද, පෙත්සම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය දක්වෙන කොටස R15 වශයෙන් ද දෙවන පාර්ශ්වය ලකුණු කර ඉදිරිපත් කරන ලදී. 2013.07.29 දින කාර්ය සටහන් පිටු අංක : 2 හා 3 හි ද, 2013.12.30 දින කාර්ය සටහන් පිටු අංක : 8, 9, 10 හි ද, සාක්ෂි මෙහෙයවීමේ දී ද ලිඛිත සැළකිරීම් අංක : 7 යටතේ ද දෙවන පාර්ශ්වයේ නීතිඥ මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුකරයේ තීන්දුව මීට අදාළ කර ගැනීමට බේරුම්කරණය වෙත ඉතා දැඩි ස්ථාවරයකින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ කරුණු මා විසින් ඉතා ඕනෑ කමින් සහ අවධානයකින් සැළකිල්ලට භාජනය කරන ලදී. එකී පෙත්සම විභාගයට ගැනීමට අවසර නොදෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. අදාළ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරන ලද මූලික අයිතිවාසිකම් ගණනාවක් ආයතනයේ පාලනාධිකාරිය විසින් උල්ලංඝනය කරනු ලැබ ඇතැයි යන චෝදනාවන් පදනම් කරගෙන ය. එය ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය උඩ ඉතා සියුම් නීති තර්ක මත උගත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන් විසින් නිගමනය කරන ලදැයි විශ්වාස කරමි. බේරුම්කරණයේ විෂය පථය ඊට වඩා වෙනස් වූ නීතිය මෙන් ම බෙහෙවින් ම සිද්ධිමය කරුණු පදනම් කර ගත් යුක්තිය හා සාධාරණත්වය මත තීරණයකට එළඹීම වන නිසා මෙම සිද්ධියේ ඉදිරිපත් වූ කරුණු අනුව කිසියම් සේවකයින් පිරිසකට අසාධාරණයක් සිදු වී ද, එසේ නම් එය බේරුම් කරන්නේ කෙසේ ද යන දෘෂ්ඨියෙන් ක්‍රියා කරන්නෙමි.

- මෙම බේරුම්කරණ විභාගයේ දී දෙවන පාර්ශ්වය ඉතා දැඩි බර තැබීමක් දෙමින් සාක්ෂි මගින් මතු කර පෙන්වන්නට උත්සාහ ගත්තේ පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් 2008.07.10 දිනට නිවාඩු අනුමත කරවා ගෙන නොමැති බවයි. තවද P3 චක්‍රලේඛයේ ''නිවාඩු අවංලගු කිරීම'' යන හිසින් යුතු ව නිකුත් කරනු ලැබුවත් එය නිවාඩු අවලංගු කිරීමේ චක්‍රලේඛයක් නොවන බවත්, ඉන් කියැවෙන්නේ එදිනට අසනීපයක් හෝ විශේෂ හේතුවක් ඇතිනම් නිවාඩු අවශ්‍ය කෙනෙකුට වැ. බ. සභාපතිගේ පූර්ව අනුමතිය ලබා ගත යුතු බවත් ය. එම ස්ථාවරයන්හි පරස්පර ගැටෙන ස්වභාවයක් මනා ව දිස් විය.

අනෙක් අතට පළමුවැනි පාර්ශ්වය ඉතා පැහැදිළි ව පෙන්වා දුන්නේ 2008.07.10 දිනට තමන්ට නිවාඩු අනුමත කරවා ගැනීමේ අවශ්‍යතාවක් පැන නොනැගි බවත්, එදින තමන් පැහැදිළි ව ම වෘත්තිය ක්‍රියාමාර්ගයක් වශයෙන් සංකේත වැඩ වර්ජනයකට සහභාගි වූ බවත් ය. වැඩ වර්ජනයක් කරන අවස්ථාවක සේවකයින් නිවාඩු ලබාගෙන වැඩ වර්ජනයකට සහභාගි වීමේ පිළිවෙතක් නොමැත. එමගින් දෙවැනි පාර්ශ්වයේ එම රැකවරණය මම ඉඳුරා ම ප්‍රතික්ෂේප කරමි.

- වෘත්තිය සමිති ආඥා පනතේ සහ කාර්මික ආරවුල් පනතේ ''අසාධාරණ කම්කරු පිළිවෙත්'' ලෙස දක්වා ඇති විධිවිධාන මගින් සේවකයින්ගේ වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයන් ලෙස සංකේත වැඩ වර්ජනයක යෙදුනු දිනයකට වැටුප් නොගෙවා එකී දිනය ඔවුන්ගේ පටිපාටිගත වැටුප් රහිත නිවාඩු ලෙස සළකනු ලැබීම හුදු හේතුව කොට ඔවුන්ගේ උසස් වීම් අඩාල කිරීම අසාධාරණ ය.

- මෙම නඩු නිමිත්ත ම දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා විසින් සමථකරණය කරද්දී P10b ලෙස ලකුණු කළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නීති නිලධාරිනිය විසින් එකී සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයේ (e) ඡේදයේ පැහැදිලි ව කියා ඇත්තේ මෙහි ඉල්ලුම්කරුවෙකු වන ආර්. එම්. පී. රාමනායක මහතා ''.............. 2008.07.10 දින වැටුප් රහිත නිවාඩුවක් ලබා ගැනීම හේතුවෙන් ගබඩා භාරකරු I ශ්‍රේණියට උසස් කර නොමැත.'' යනුවෙනි. P12b ලේඛනයේ (g)

ඡේදය මගින් එච්. එම්. ඒ. බණ්ඩාර මහතා සම්බන්ධයෙන් ද, P13b ලේඛනයේ 4 ඡේදය මගින් ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න සම්බන්ධයෙන් ද එලෙස ම වාර්තා කර ඇත.

- ඒ අනුව මෙහි දී මතු වන ඉතා පැහැදිලි කරුණක් වන්නේ :
  - (අ) 2008.07.10 දින වැටුප් රහිත නිවාඩුව ලබා තිබීමේ හේතුව නිසා ම ඉහත කී තිදෙනාට ස්වයංක්‍රීය ව ලැබිය යුතු උසස් වීම් අහිමි වී ගොස් ඇති බවත්,
  - (ආ) 2008.07.10 දින වැටුප් රහිත නිවාඩුව ඔවුන්ට නියම වී ඇත්තේ මෙහි විස්තර සහිත ව සඳහන් කර ඇති සංකේත වැඩ වර්ජනයට සහභාගි වීම නිසා බවත් ය.

- පළමුවැනි පාර්ශ්වයේ අනෙක් ඉල්ලුම්කරු ආර්. ඒ. හේමසිරි යන අයට ද මේ තත්ත්වය පොදුවේ බලපා ඇති බව නිසැකය. ඔහුගේ උසස් වීම ස්වයංක්‍රීය උසස් වීමක් නොවේ. P15 හි දැන්වීම මගින් ප්‍රසිද්ධ කොට ඇති පරිපාලක (යාන්ත්‍රික) 11 ශ්‍රේණිය තනතුර සඳහා ආර්. ඒ. හේමසිරි මහතා අයදුම් කර ඇති අතර 2010.06.08 දින පැවති සම්මුඛ පරීක්ෂණයට මුහුණ දී ඇත. එම සම්මුඛ පරීක්ෂණයේ දී ඔහුට බරපතල ලෙස අසාධාරණයක් සිදු කළ බව පෙන්වීමට පළමු පාර්ශ්වයේ සාක්ෂි මෙහෙයවීමේ දී දැඩි ලෙස උත්සහා ගෙන ඇත.

2013.05.15 දින කාර්ය සටහන් පිටු 16 සහ 17 හි :

''ප්‍ර. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී සිද්ධ වුනේ කුමක් ද කියලා මෙම අධිකරණයට කියන්න පුළුවන් ද?

උ. මගේ දැනීමේ හැටියට නම් මම සම්මුඛ පරීක්ෂණයට කැඳෙව්වා. මට අදාළ සහතික පත්‍ර ඉදිරිපත් කරන්න කිව්වා. මම ඉල්ලා තිබූ ඉල්ලුම්පත්‍රය අනුව කටයුතු කළා. සම්මුඛ පරීක්ෂණ කමිටුවේ 05 දෙනෙක් සිටියා. ඊට පස්සේ මගේ අංකයට කථා කල පසුව මගේ ලිපි ගොනුවේ ලිපි එකින් එක පරීක්ෂණයට භාජනය කළා. පරීක්ෂාකර පත්කිරීම සිද්ධ කරන අවස්ථාවේ දී ජ්‍යෙෂ්ඨ ආයතන සහකාරතුමා වෙත ඉදිරිපත් කරලා මොහුට වැටුප් රහිත නිවාඩුවක් අනුමත වෙලා තියෙනවා එම නිසා පරීක්ෂා කිරීමට අපහසුතාවයක් තිබෙනවා කියලා කිව්වා.

ප්‍රඃ සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ සම්මුඛ පරීක්ෂණය කරන අවස්ථාවේ දී තමන් ඊට ප්‍රථම වැටුප් රහිත නිවාඩුවක් ලබාගෙන තිබීම නිසා සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන්න බෑ කියල ද කිව්වෙ?

උ : ඔව්. ඒ අවස්ථාවේ දී මගේ අංශ භාර සහකාර ඉංජිනේරුවරයාත් එහි සිටියා. ඔහු අනෙක් නිළධාරින් සමග සථාබහක යෙදුණා. ඔහු කිව්වා එලෙස පරීක්ෂණය කරන්න බැහැ නම් මොහුව ඒ සඳහා කැඳෙව්වෙ කියලා ඇහුවා. ඒ අවස්ථාවේ දී මම රාජකාරියේ සිටියේ එම නිසා තමයි ඔහුට ප්‍රශ්නයක් වුනේ මාව කැඳෙව්වේ ඇයි කියලා.

ප්‍ර : සාක්ෂිකරු තමන් ඊට පස්සේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කළා ද?

උ : කෙරුණා නොකෙරුණා හා සමානව තමයි එය සිදු වුණේ.

ප්‍ර : තමන් මෙම ගරු අධිකරණයට ප්‍රකාශ කරන්නේ තමන්ව නිසි පරිදි සම්මුඛ පරීක්ෂණයට භාජනය වුණේ නෑ කියලා ද?

උ : ඔව්.''

2014.01.27 දින කාර්ය සටහන් පිටු 21 සහ 22 හි :

''ප්‍ර : මෙම හේමසිරි යන ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයට වාඩි වුන අවස්ථාවේ ම, ඔබ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ප්‍රකාශ කළා මොහු සුදුසු පුද්ගලයෙක් නොවේ. මොහු නෝපේ ගිය පුද්ගලයෙක් කියල?

උ : නැහැ.
එසේ සාමාන්‍යයෙන් සම්මුඛ පරීක්ෂණයට කැඳවුවාට පස්සේ ඔහුගේ ලිපිගොනු පරීක්ෂා කරමින් යන අතරේ දී එම වැටුප් රහිත නිවාඩු හෝ විනය දඬුවම් ලබා ගත් අයෙක් නම් ඒ බව ඔහුට ඒ අවස්ථාවේ දී පැහැදිලි කරලා දෙනවා. මෙහෙම තත්ත්වයක් තිබෙනවා කියන එක ඔහුට පැහැදිළි කර ඒ සම්බන්ධයෙන් ඔහු විසින් දක්වන ප්‍රශ්න විචාරය අනුව සමහරක් අවස්ථාවලදී වැටුප් රහිත නිවාඩු සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කළ බව අපේක්ෂකයින් පවසනවා. එවැනි තත්ත්වයක සත්‍ය අසත්‍යතාව පසුව සනාථ කර ගැනීමට කටයුතු කරනවා.

ප්‍ර : සාක්ෂිකරු මම තමුන්ට යෝජනා කරන්නේ මෙම හේමසිරි යන ඉල්ලුම්කරු සම්මුඛ පරීක්ෂණයට වාඩි වූ අවස්ථාවේ දීම ඔබ මානව සම්පත් අංශයේ නිලධාරියා වශයෙන් ඔහුට ප්‍රකාශ කළා ඔබ නෝපේ (වැටුප් රහිත නිවාඩු) ලබාගෙන තිබෙනවා කියා.

උ : ප්‍රතික්ෂේප කරනවා. අනිවාර්යයෙන්ම වැටුප් රහිත නිවාඩු හෝ විනය දඬුවමක් ඇති සේවකයෙක් සම්මුඛ පරීක්ෂණයකට පැමිණ විට එම අවස්ථාවේ දී ඒ බව ඔහුට අනිවාර්යයෙන්ම දැනුම් දෙනවා.

ප්‍ර : මම තමුන්ට තවදුරටත් යෝජනා කරනවා මෙම ඉල්ලුම්කරුගෙන් කිසිදු ප්‍රශ්නයක් ඇහුවේ නැහැ කියලා?

උ : ප්‍රතික්ෂේප කරනවා.''

සම්මුඛ පරීක්ෂණයේ දී හේමසිරි මහතාට නියමිත ලකුණු නොදීම මගින් සාධාරණයක් ඉටු නොවූ ස්ථාවරයක් ගොඩනැගීමට පළමුවන පාර්ශ්වය සාක්ෂි මෙහෙයවීමේ දී බලවත් උත්සාහයක් ගත්තේ ය.

P18 ලේඛනය අනුව හේමසිරි මහතාගේ තත්ත්වය සම්බන්ධයෙන් උද්ගත වන පහත සඳහන් කරුණු මගේ නිරීක්ෂණයට ලක් විය.

- (අ) ලිඛිත පරීක්ෂණයේ දී ඔහුට ලකුණු සීයෙන් 50.67 ක් ලැබී ඇත. එය ලිඛිත පරීක්ෂණයේ එකී ලකුණු 55 න් ලෙස ගණනය කිරීමේ දී උපයාගෙන ඇත්තේ 55 න් 27.87 කි.
- (ආ) එම ලකුණට සමාන ලෙස ලකුණු ලබා ගත් තවත් කෙනෙකු සිටී. එනම් ආර්. ආර්. ඒ. කමල් නන්දන නැමැත්තෙකි.
- (ඇ) සම්මුඛ පරීක්ෂණයේ දී හේමසිරි මහතාට සම්පූර්ණ ලකුණු එනම් 10 න් 10 ම ලැබී ඇත්තේ සේවයට සහ පළපුරුද්දට ය. එම කොටසට ලකුණු කිසිවක් අඩු කර නොමැත.

(ඈ) ප්‍රශංසා වලට ලකුණු 5න් 2ක් ලැබී ඇති අතර සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනයට ලැබී ඇත්තේ 5 න් 1 ක් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී ඔහුට මුහුණ දීමට සිදු වූ ඉහතින් කියැවුණු

තත්ත්වය යටතේ ඔහුට යම් අසාධාරණයක් සිදුවුනා දැයි යම් අනුමානයක් ඇති වෙතත් එය හුදෙක් සැකයකට පමණක් සීමා කිරීමට සිදු වේ. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ඇති 26 දෙනාගෙන් 5 දෙනෙකුට ම 5 න් 1 ක් ලැබී ඇත. හේමසිරි මහතා හැර සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන් සෙසු අය මෙහි ඉහත කී සංකේත වැඩ වර්ජනයට සහභාගි වූ අය නොවේ.

(ඉ) සම්මුඛ පරීක්ෂණය අවසානයේ, ලිඛිත පරීක්ෂණ ලකුණු ද සමග එකතු කළ මුළු ලකුණු පෙළ ගැස්වා කළ හේමසිරි මහතා 13 වැනි තැනට පත් වී ඇත.
(ඊ) ඔහුට ලැබී ඇති මුළු ලකුණු සංඛ්‍යාව 54.87කි.
(උ) P18 ලේඛනයේ එකී 26 දෙනා අතුරෙන් හේමසිරි මහතාගේ නමට ඉදිරියෙන් ''No Pay'' යනුවෙන් සටහනක් යොදා ඇත.
(ඌ) P19 ලේඛනයේ ඇති අවසාන තේරීම් ලැයිස්තුව සකස් කිරීමේ දී හේමසිරි මහතාගේ නම ඉවත් කරනු ලැබ ඇත.

මෙම කරුණු විශ්ලේශනය කිරීමේ දී බැලූ බැල්මට හේමසිරි මහතාට යම් අසාධාරණයක් සිදු වී ඇති දැයි යම් අවිශ්වාසයක් ගොඩනැගීමට ඉඩක් ඇතත් එය එසේ ම සිදු වූ බවට ප්‍රමාණවත් ව සනාථ කිරීමට පළමුවැනි පාර්ශ්වය සමත් වී නැත. තවද P19 ලේඛනයේ අංක : 15 යටතේ සඳහන් වන එස්. ඒ. ඒ. පී. සුහසිංහ යන අය අවම සුදුසුකම් සපුරා නොමැති බවටත්, සම්මුඛ පරීක්ෂණයට සහභාගි නොවූ බවටත් හේමසිරි මහතාගේ සාක්ෂි විභාගයේ දී (2013.05.15 දින කාර්ය සටහන් පිටු අංක : 20 හා 21) ඉස්මතු කරයි. ඔහු සම්මුඛ පරීක්ෂණයට නොපැමිණි බව තහවුරු කිරීමට පළමුවැනි පාර්ශ්වය අසමත් විය. තවද ඔහුගේ මූලික අවම සුදුසුකම් වල අඩුපාඩු ඇතත් විශේෂ හේතුන් මත සම්මුඛ පරීක්ෂණයට කැඳවීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සිදු වී ඇත. (P27 ලේඛන) තවද P19 හි ද නිර්දේශිත නම් අතර අංක 15 යටතේ සුහසිංහ යන නම ඉදිරියෙන් ඒ බවට ලියන ලද සටහනක් ඇත.

මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සකස් කරන ලද P19 ලේඛනයේ හේමසිරි මහතාගේ නම සඳහන් නොවේ. ඔහු ලබා ගත් ලකුණු සංඛ්‍යාව පදනම් කරගෙන එකී නිර්දේශිත ලයිස්තුවේ කොතැනක හෝ ඔහුගෙත් නම සඳහන් විය යුතු ව තිබුණි. ඒ අනුව අනුගමය වන්නේ හේමසිරි මහතා මෙහි සඳහන් වන වෘත්තිය ක්‍රියා මාර්ගය හේතුවෙන් වැටුප් රහිත නිවාඩු තත්ත්වය යටතේ ඔහුගේ නම ඉවත් කරනු ලැබ ඇති බවයි.

කෙසේ වුවත් ඔහු ලබා ගත් ලකුණු සංඛ්‍යාවන් සැළකිල්ලට ගත් කළ එම ලයිස්තුවේ හේමසිරි මහතාගේ නම සඳහන් විය හැකි වන්නේ පොරොත්තු ලේඛනයේ අංක : 5 හි සඳහන් මුළු ලකුණු 55.15 ක් ලබා ගත් එච්. ඒ. සෝමසිරි හෙට්ටිආරච්චිට පසු ව ය. එනම් පොරොත්තු ලේඛනයේ අංක : 6 යටතේ ය.

පළමුවැනි පාර්ශ්වය 2013.05.15 දින කාර්ය සටහන් වල 21 සහ 26 දක්වා පිටුවල දී උත්සාහ ගෙන ඇත්තේ හේමසිරි මහතාට වඩා අඩු ලකුණු ලබා ගත් ඇතැම් අයටත්, පී. ඒ. චිත්‍රාල් සහ ඒ. එන්. එස්. බණ්ඩාර යන අයවලුන්ටත් උසස් වීම් ලබා දුන් නමුත් හේමසිරි මහතාට ලැබිය යුතු උසස් වීම් ලබා නොදුන් බව පෙන්වීමට ය. චිත්‍රාල් සහ බණ්ඩාර යන දෙදෙනාට උසස් වීම් ලබා දී ඇත්තේ වෙන ම පටිපාටියක් යටතේ සනාථ විය. අනෙක් අතට හේමසිරි මහතා තැබිය යුතු පොරොත්තු ලේඛනයේ 6 ස්ථානයට හෝ ඉන් ඔබ්බට උසස්වීම් ලබා දී ඇති බවට ඔප්පු කිරීමට පළමුවැනි පාර්ශ්වය සමත් වී නැත.

ඒ අනුව හේමසිරි මහතාට උසස් වීම නොලැබීම සම්බන්ධයෙන් 2008.07.10 දින පැවති සංකේත වැඩවර්ජනයට සහභාගි වීමේ ප්‍රතිවිපාක යම් ආකාරයකින් බලපා ඇති බව පෙනී යතත්, ඔහුගේ උසස් වීම හුදෙක් ඒ නිසා ම පමණක් සිදු වූ බව ඉඳුරා ම කිව නොහැකිය. 2008.07.10 දින වැඩ වර්ජනයට සහභාගි නොවී, එදිනට වැටුප් රහිත නිවාඩු නොලැබූවත් ලිඛිත හා වාචික පරීක්ෂණ ප්‍රතිඵල මත ඔහුට මෙකී උසස් වීම ලැබීමට හිමිකමක් නොලැබෙන බව අනාවරණය විය.

## නිගමන

සාක්ෂි මෙහෙයවීම, ලේඛන ඉදිරිපත් කිරීම, දෙපාර්ශ්වයේ ලිඛිත සැළකිරීම් ඇතුළු බේරුම්කරණ විභාගයේ සමස්ත පටිපාටිය අධ්‍යයනය කිරීමෙන් පසු ව කරන ලද ඉහත සඳහන් නිරීක්ෂණ ඇසුරෙන් පහත නිගමනයන්ට එළඹෙමි.

1. පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් අතුරෙන් එච්. එම්. ජේ. බණ්ඩාර, ආර්. එම්. ජී. රාමනායක සහ ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න යන තිදෙනාට ස්වයංක්‍රීය ව තමන්ගේ සේවයේ ලැබිය යුතු වූ උසස් වීම් 2008.07.10 වැනි දින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පැවති සංකේත වැඩවර්ජනයට සහභාගි වීම (වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළඹීම) මත පැනවුණු වැටුප් රහිත නිවාඩුව නිසා අසාධාරණ ලෙස අහිමි වූ බව,

2. එකී වැඩවර්ජනයට සහභාගි නොවුයේ නම් ඔවුන්ට ලැබිය යුතු වූ එකී ස්වයංක්‍රීය උසස් වීම් ලැබෙන අතර, ඔවුන් එකී වැඩවර්ජනයට සහභාගි වීමේ වක්‍ර ප්‍රතිවිපාකයක් ලෙස ඔවුන්ට ලැබිය යුතු වූ ස්වයංක්‍රීය උසස් වීම් අහිමි වූයේ ය යන්න සනාථ වූ බව,

3. එම නිසා එකී ඉල්ලුම්කරුවන් තිදෙනාට අහිමි වූ නියමිත උසස් වීම් සියල්ල ලබා දී, ඊට අනුරූප ව මේ වන තෙක් අහිමි වූ වැටුප්, දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ ද ගණනය කොට ලබා දිය යුතු බව,

4. ආර්. ඒ. හේමසිරි නැමති පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ උසස් වීම නොලැබීමට 2008.07.10 වැනි දින පැවති එකී වෘත්තිය ක්‍රියාමාර්ගය හා ඒ නිසා පැනවුණු වැටුප් රහිත නිවාඩුව යම් ආකාරයක අහිතකර බලපෑමක් සිදු කර ඇති නමුත් ඔහුට එකී උසස් වීම අහිමි වුනේ හුදෙක් ම ඒ හේතුව නිසා නොවන බව,

5. මෙම නිගමනයන් එක් එක් ඉල්ලුම්කරුවන්ගේ තත්ත්වයන් තනි තනි ව පරීක්ෂාවට භාජනය කොට එළඹි ඒවා වන අතර, පොදු සාධකයක් ලෙස ගෙන කටයුතු කිරීම අහිතකර වන බව සහ ඒ හේතුවෙන් මෙම නිගමනයන් මෙම බේරුම්කරණ විභාගයේ පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හතර දෙනාට පමණක් පෞද්ගලික විය යුතු බව.

ප්‍රදානය

1. පළමුවැනි පාර්ශ්වයේ ;

(අ) ආර්. එම්. ජී. රාමනායක මහතාට ස්වයංක්‍රීය ව ලැබිය යුතු ගබඩා භාරකරු I ශ්‍රේණියට උසස් වීම ලබා දිය යුතු ය.

(ආ) ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න මහතා ස්වයංක්‍රීය ව ලැබිය යුතු වැඩ අධිකාරි විධායක I ශ්‍රේණියට උසස් වීම ලබා දිය යුතු ය.

(ඇ) එච්. එම්. ජේ. බණ්ඩාර මහතාට ස්වයංක්‍රීයව ලැබිය යුතු ගබඩා භාරකරු I ශ්‍රේණිය උසස් වීම ලබා දිය යුතු ය.

එකී උසස් වීම් තුනම 2009 අප්‍රේල් මස සිට හෝ ඔවුනොවුන්ට පෞද්ගලික ලිපිගොනු අනුව ස්වයංක්‍රීය උසස් වීම් හිමි විය යුතු දිනයන්හි සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කළ යුතු ය.

2. ඉහත නම් සඳහන් ආර්. එම්. ජී. රාමනායක, ඩබ්ලිව්. එච්. සුසිල් ප්‍රේමරත්න සහ එච්. එම්. ජේ. බණ්ඩාර යන ඉල්ලුම්කරුවන් තිදෙනාට එයට අනුරූපව ලැබිය යුතු ඊළඟ අදියරයන්හි උසස් වීම් ලබා දී, අදාළ වැටුප්තල වල පිහිටුවා මේ දක්වා ඒවා යාවත්කාලීන කළ යුතු ය. මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වී එක් මසක කාලයක් ඇතුලත එම කටයුතු නිම කොට දෙවන පාර්ශ්වය විසින් දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත දැනුම් දිය යුතු ය.

3. ඒ අනුව ඔවුන්ට අහිමි වූ හිඟ වැටුප්, දීමනා ආදිය පෞද්ගලික ලිපි ගොනු අනුව ගණනය කොට ලබා දිය යුතු ය.

4. පළමුවැනි පාර්ශ්වයේ ආර්. ඒ. හේමසිරි යන අයට ඔහු ඉල්ලා සිටින පාරිපාලක II ශ්‍රේණියේ තනතුරට උසස් වීම හිමි නොවිය යුතු ය.

5. බේරුම්කරුණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් කිසිදු වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවිය යුතු ය.

6. මෙකී ප්‍රදානයන්ට අදාළ සියළු ගෙවීම් ගැසට් පත්‍රය පළ වී එක් මසක කාලයක් ඇතුළත පළමුවන පාර්ශ්වය වෙත ගෙවීම සඳහා දෙවන පාර්ශ්වය විසින් දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කොමසාරිස් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

සටහන : මෙම බේරුම්කරණ විභාගයේ ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම පෞද්ගලික හේතූන් නිසා අනපේක්ෂිත ලෙස ප්‍රමාද වීම පිළිබඳ වත් ඒ නිසා පාර්ශ්වකරුවන් අපහසුතාවට පත් වූයේ නම් ඒ පිළිබඳව ඔවුන් වෙත කණගාටුව පළ කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2015.11.16 දින,
කාර්මික අධිකරණයේ දී ය.

02 - 82

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.